# ප්‍රසිද්ධ දැන්වීමයි.
## පාණදුර නගර සභාව
## තනතුරු පුරප්පාඩු

ආදායම් පරීක්ෂක පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුව සීමිත වශයෙන් බඳවා ගැනීම.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවය , පාණදුර නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති ආදායම් පරීක්ෂක තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පුරප්පාඩු තනතුරු**

**තනතුරු නාමය :-** ආදායම් පරීක්ෂක 111 ශ්‍රේණිය

**පුරප්පාඩු ගණන :-** 06

**අධ්‍යාපන සුදුසුකම් :-** අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

**වෙනත් / වෘත්තීය සුදුසුකම් :-** අදාළ නැත.

**වැටුප් පරිමාණය :-** MN 1 – 2025 45,230 - 10×540 - 11×630 - 10×890 - 10×1,190 – 78,360

**බඳවා ගැනීම / පළපුරුද්ද :-** බඳවා ගැනීම (ලිඛිත විභාගය)

***සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය.**
මෙමඟින් ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ දැනුම හා භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කෙරේ.

***ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම.**
පළාත් පාලන අණ පනත් මඟින් ඒ ඒ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ආදායම් එක් රැස් කිරීම පිළිබඳව පැවරී ඇති බලතල, පළාත් පාලන ආයතනයක ඇති ආදායම් උත්පාදන ප්‍රභවයන් පිළිබඳව, කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු පැනවීම හා එක්රැස් කිරීම, නොගෙවන අවස්ථාවලදී නීතිමය කටයුතු කිරීම පිළිබඳව, අයවැය ඇස්තමේන්තු සැකසීමේදී ආදායම් පරීක්ෂකගේ දායකත්වය පිළිබඳව, වරිපනම් බදු, අක්කර බදු පැනවීම, දැන්වීම් නිකුත් කිරීම, අයි ගාස්තු පැනවීම, වට්ටම් ලබාදීම ආදිය පිළිබඳව මූලික දැනුම පරීක්ෂා කිරීම.

***පළපුරුද්ද**
පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිඳු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි:**

I. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
II. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.
III. මෙම ආයතනයේ ඕනෑම ස්ථානයක තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමට, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් ද යුක්ත විය යුතුය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
V. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේදී, බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට ආදාළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම් සහ, ව්‍යවස්ථා ආදේශ කිරීම් ද, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම, පාණදුර නගර සභාවේ ලේකම් සතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් වේ.
II. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
III. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.
IV. මෙම බඳවා ගැනීම් කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජන රජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද /රජයේ මුදල් රෙගුලාසි වලටද /රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද බස්නාහිර පළාත් සභාව හෝ පාණදුර නගර සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

**04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.**

I. අධ්‍යාපන සහතික
II. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
III. වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික
IV. සේවා සහතිකය.

**05. ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත 2026.04.30 දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල මඟින් ලේකම්, පාණදුර නගර සභාව, පාණදුර යන ලිපිනය වෙත එවීමට කටයුතු කරන්න.**

**සභාපති / ලේකම්,**
2026 අප්‍රේල් මස 09 දිය.
පාණදුර නගර සභාව.
038-2232275